**විෂය** - ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

**ශ්‍රේණිය** - 8

**මාසය** - නොවැම්බර් **සතිය** - 15 **ක්‍රියාකාරකම් අංකය** - 15

**සැකසුම- බී.ආර්.මහේෂිකා ගල්වත්ත,කලාප අධ්‍යාපන කාර්යාලය,ඇඹිලිපිටිය**

## 4. ව්‍යාපාර

## 4.3 භාණ්ඩයක මිල ගණනය කරමු.

**ශිෂ්‍ය කාර්යය**

- ✓ ඔබගේ කියවීම් පොතෙහි පිටු අංක 120 හා 121 හොඳින් කියවා තේරුම්ගන්න.
- ✓ අමාරු/අපහසු පාඩම් කොටස් වැඩිහිටියෙකු/ ගුරුවරයෙකු ගෙන් විමසා අවබෝධ කරගන්න.
- ✓ මෙහි පහත දක්වා ඇති මාර්ගගත හෝ මුද්‍රිත ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්, පාඩම් ලබාගෙන ඉගෙනගන්න.
- ✓ ක්‍රියාකාරකම සිදුකිරීමේදී ඔබට එන ගැටළු ඔබේ යහළුවන්, වැඩිහිටියන් හා ගුරුවරුන් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබාගන්න.

**මෙම පාඩම තුළින් ලබාගත හැකි ඉගෙනුම්ඵල**

- ✓ භාණ්ඩයක ඍජු හා වක්‍ර පිරිවැය වෙන වෙන්ව හඳුනාගනිමින් පෙළගස්වයි.
- ✓ භාණ්ඩයේ මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරයි.
- ✓ ලාභාන්තිකයක් සහිතව මිල තීරණය කරයි.

**ඇගයීම්/ තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘතිය**

1. **ඔකිඩ් පැළ නිෂ්පාදනය කර අලෙවිකරන්නෙකු තබන ලද වියදම් වාර්තාවක් පහත දැක්වේ.**

| | හේතුව | වියදම |
|---|---|---|
| 1 | ඔකිඩ් පැල 10 ක් සඳහා වියදම | 5000.00 |
| 2 | මැටි පෝච්චි සඳහා වියදම | 250.00 |
| 3 | පොල් ලෙලි කැබලි සඳහා වියදම | 200.00 |
| 4 | අඟුරු සඳහා වියදම | 500.00 |
| 5 | ප්‍රවාහන ගාස්තු | 500.00 |
| 6 | ජල බිල්පත | 500.00 |

| | | |
|---|---|---|
| 7 | විදුලි බිල්පත | 450.00 |
| 8 | උපදේශක සේවා ගාස්තු | 500.00 |
| 9 | උපදේශක සංග්‍රහ වියදම් | 250.00 |
| 10 | කුලී වියදම් | 1500.00 |
| 11 | ශ්‍රම වියදම් | 5000.00 |

i. ඉහත වියදම් සෘජු හා වක්‍ර පිරිවැය ලෙස වෙන් කර පහත සෘජු හා වක්‍ර පිරිවැය ගණනය කිරීමේ ලේඛනයේ සටහන් කරන්න.

| | | |
|---|---|---|
| *සෘජු පිරිවැය*<br>*අමු ද්‍රව්‍ය වියදම්*<br>..................................................<br>..................................................<br>..................................................<br>..................................................<br>*ශ්‍රම වියදම්*<br>*වක්‍ර පිරිවැය*<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>..........................................................................................<br>*මුළු නිෂ්පාදන පිරිවැය* | | |

ii. සෘජු පිරිවැය, වක්‍ර පිරිවැය, මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

iii. මල් පැළයක ඒකක නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.

iii. මල් පැළයක් සඳහා නිෂ්පාදන පිරිවැය මෙන් 20% ක ලාභයක් ලැබීමට නිෂ්පාදකයා තීරණය කළේ නම් මල් පැළයක මිල කොපමණ වේද?

6. පිරිවැය අඩු කර ගත හැකි ක්‍රම ලයිස්තුගත කරන්න.